---

## කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව
## මහනුවර දිස්ත්‍රික්කය

--------------------

**1. <u>මූල්‍ය ප්‍රකාශන</u>**

**1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 අගෝස්තු 27 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

**1.2 <u>මතය.</u>**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

**1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

වර්ෂ තුනක පමණ කාලයක සිට පැවත එන රු.15,766 ක් වූ අවිනිශ්චිත ගිණුම් හර ශේෂය හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.281,212,497 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**2 <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>**

**2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.49,412,279 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.28,157,554 ක් විය.

## 2.2 බැංකු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) මහජන බැංකුවේ අංක 157100190000052 දරන බැංකු ජංගම ගිණුම**

(i) නිකුත් කළ නමුත්, ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ වර්ෂ 02 ක කාලයකට වඩා වැඩි රු.53,880 ක චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ඩී පරිදි කටයුතු කර නොතිබුණි.

(ii) විස්තර සොයා ගත නොහැකි රු.953,753 ක් වූ හඳුනා නොගත් ලැබීම් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

(iii) වර්ෂ 02 කට කාලයක වූ පැරණි අගරු වූ චෙක්පත් 4 ක වටිනාකම රු.76,600 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

(iv) වර්ෂ 02 සිට 04 දක්වා වූ කාලයක රු.376,000 ක් වටිනා උබලබ්ධි නොවූ තැන්පත් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග අනුගමනය කර නොතිබුණි.

(v) වර්ෂ කිහිපයක සිට පැවත එන වටිනාකම රු.643,439 ක් වූ හඳුනා නොගත් ගෙවීම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ලංකා බැංකුවේ අංක 002601599 දරන ජංගම ගිණුම**

(i) නිකුත් කර මාස 06 ක් ඉක්මවා ඇතත්, ගෙවීම පිණිස ඉදිරිපත් නොවූ රු.34,055 ක චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

(ii) ගිණුමේ දක්වා ඇති වටිනාකම රු.4,885 ක් වූ අගරු චෙක්පත් පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබූ අතර, ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය.

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 33,617 | 8,991 | 9,501 |
| (ii) | බදු කුලී | 9,405 | 2,444 | 1,759 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,385 | 4,297 | -- |
| (iv) | වෙනත් ආදායම් | 30,981 | 55,089 | 45,698 |

**2.3.2** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබු මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 1,324,037 |
| (ii) | මුද්දර ගාස්තු | 42,154,819 |

**2.3.3** <u>පරිසර බලපත්‍ර ගාස්තු</u>

1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත ව්‍යාපෘති සඳහා පරිසර බලපත්‍ර ලබා ගත යුතු වුවද ව්‍යාපාරික ආයතන 10 කට අදාළව 2012 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබුනෙන් සභාවට අයවිය යුතු රු.74,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

**2.3.4** <u>වරිපනම් බදු</u>

2012 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වරිපනම් රු.8,400,379 ක් තුළ වසරකට අධික කාලයක සිට දේපළ 58 කින් අය වියයුතු හිඟ වරිපනම් ආදායම රු.3,079,057 ක් විය. රජයේ දේපළ 21 කින් අය වියයුතු රු.628,855 ක හිඟ ශේෂයක්ද එයට ඇතුළත් විය.

## 2.4 කොන්ත්‍රාත් පරිපාලනය

කොන්ත්‍රාත් පිළබඳව සිදුකළ නියැදි විගණන පරීක්ෂණ සහ භෞතික පරීක්ෂණයන්හිදී විවිධ අඩුපාඩු නිරීක්ෂණය විය. විස්තර පහත වගුවෙහි දැක්වේ.

| කොන්ත්‍රාත්තුව | නිරීක්ෂණ |
|---|---|
| (i) ට්‍රිනටි ගාර්ඩින් රයිෆල් බලකාය පාර ගල් අතුරා තාර දැමීම | • ප්‍රමාණ බිල්පත්‍රයක් සකස් කර නොතිබීම.<br>• වැඩ විෂය අංක 02,05 සහ 06 යටතේ රු.194,989 ක් වූ වැඩිපුර ගෙවීම් කර තිබුණි.<br>• ගෙවීම් වාර්තා අනුව පාරේ ඝනකම 41/2”- 5” වූ අතර තථ්‍ය ඝනකම 3” ක් පමණක් විය. |
| (ii) බලගොල්ල බටහිර ක්‍රීඩාපිටිය (අභීත ක්‍රීඩාංගනය) සංවර්ධනය කිරිම | • මධ්‍යම පලාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත සම්මත මිල උපලේඛනය හා සසඳන කල රු.78,486 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (iii) මෙරගල් ගම්මැද්ද පාර ඉදි කිරීම<br>(iv) මෙරගල් ගම්මැද්ද පාළම ඉදි කිරීම<br>(v) දුනුහප්පාව ජල යොජනා ක්‍රමය | • 2012 දෙසැම්බර් 31 දිනට නිම නොකළ වැඩ වෙනුවෙන් බිල්පත් මත රු.793,589 ක් ප්‍රතිපූර්ණය කර තිබුණු අතර තථ්‍ය බිල්පත් අනුව රු.589,745 ක් විය. |
| (vi) හකමුණ එක්සත් සුභ සාධක සමිතියේ ප්‍රජාශාලාව ඉදිකිරිම | • රු.34,823 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (vii) කුඹුක්කඳුර උතුර මැදගම්මැද්ද එල්ලෙන පාළම අළුත්වැඩියා කිරීම. | • වැඩ විෂයන් 10 ක් යටතේ ඉටු නොකළ වැඩ වෙනුවෙන් සාවද්‍ය ලෙස රු.574,577 ක් ගෙවා තිබුණි. |

## 2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගිණුම්වල දක්වා ඇති තැන්පත් තුළ වසර 02 ක් ඉක්ම වූ රු.173,150 ක තැන්පතු, සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ සේවය කර ස්ථාන මාරුවීම් ලබා ගොස් ඇති, වැඩ තහනමකට ලක්ව ඇති හා විශ්‍රාම ගන්වනු ලැබූ නිලධාරින්ගෙන් වසර 01 සිට වසර 10 දක්වා කාල පරාසයකට අදාල හිඟ සේවක ණය වටිනාකම වූ රු.613,479 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 මාර්තු මස 20 දින සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී බාහිර පුද්ගලයෙකු විසින් සභා අනුමැතියකින් හා ගිවිසුමකින් තොරව පොදු වැසිකිලි 02 ක් නඩත්තු කරනු ලබන අතර, මැණික්හින්න මහජන වැසිකිලිය වෙනුවෙන් ගාස්තු අය කරන බව නිරීක්ෂණය විය.

**3.** <u>**පද්ධති හා පාලන**</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) ගබඩා පාලනය